**දික්වැල්ල ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට සභා බලප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 13 ක් වෙනුවෙන් අය විය යුතු රු.606,825 ක් වූ දැන්වීම් පුවරු ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි. | අදාළ දැන්වීම් පුවරු ගාස්තු අයකරගත් පසු 2023 මුල්‍ය ප්‍රකාශය තුලින් ගැලපීම් සිදු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | පසුගිය වර්ෂයන්හි හා සමාලෝචිත වර්ෂයේදී අපහරණය කරන ලද රු.2,867,155 ක වටිනාකමින් යුත් රථවාහන 08 ක් ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් නොකර මෝටර් රථ හා කරත්ත යටතේ ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | රු.22,805,000 ක් වටිනා ඉඩම් කැබලි 06 ක් ඉඩම් හා ගොඩනැඟිලි යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | අදාළ තොරතුරු සොයාබලා ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඈ) | ඉකුත් වර්ෂයේදී සභාව සතු ඉඩම් හා ගොඩනැඟිලි සංවර්ධනය කිරීම සඳහා දරන ලද රු. 3,804,825 ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2023 මුල්‍ය ප්‍රකාශය තුලින් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබූ වැසිකිළි පහසුකම් ලබාදීමේ වැඩසටහන් සඳහා ණයහිමියන් යටතේ රු. 1,500,000 ක් ප්‍රතිපාදන සලස්වා තිබුණි. | වැඩසටහන ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.118,090ක් ණයහිමියන් යටතේ වැඩිපුර ගිණුගත කර තිබුණි. | මෙම ගෙවීම් සඳහා බැංකු ස්ථාවර නියෝගයක් ක්‍රියාත්මක වන බවත්, එම ගෙවීම් ඇතුළත් බැංකු ප්‍රකාශනය ජනවාරි මස ලැබෙන බැවින් දෙසැම්බර් මසට අදාළව මෙම වෙනස පෙන්වන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

**1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.378,257,147 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළ ශේෂයන් හා ඊට අදාළ උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.203,651,509 ක වෙනසක් විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විස්තරාත්මක උපලේඛන හා ශේෂ සනාථන ආදී තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.403,290,155 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 නිති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය හා 2022 අප්‍රේල් 26 දිනැති හා අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 03(xvi) වගන්තිය | දික්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රීඩා දක්ෂතා දැක්වූ පාසල් දරු දැරියන් ඇගයීම සඳහා සමාලෝචිත වර්ෂයේදී පැවති උත්සවය වෙනුවෙන් ප්‍රාදේශීය සභා අරමුදලින් රු.282,135 ක වියදමක් දරා තිබූ අතර ඒ සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද චක්‍රලේඛයේ විධිවිධානවලින් බැහැරව වියදම් දරා තිබුණි. | ආණ්ඩුකාරවරයා විසින් දුරකථනය මඟින් අදාළ වැඩසටහන යොදා ගන්නා ලෙස උපදෙස් ලබා දුන් බැවින් පූර්ව අනුමැතිය ලබා ගැනීමට නොහැකි වූ බවත්, පසු අනුමැතිය සඳහා යොමුකර ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

# 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 45,788,643 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 75,375,089 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තු ගත ආදායම රු. | 2022 බිල් කළ ආදායම රු. | 2022 රැස්කළ ආදායම රු. | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. | 2021 ඇස්තමේන්තු ගත ආදායම රු. | 2021 බිල් කළ ආදායම රු. | 2021 රැස්කළ ආදායම රු. | 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| (i) | වරිපනම් හා බදු | 7,847,400 | 4,069,966 | 3,571,612 | 2,672,202 | 7,885,900 | 3,958,100 | 2,621,835 | 2,173,848 |
| (ii) | කුලී | 8,036,590 | 4,200,221 | 3,887,151 | 1,459,675 | 7,557,300 | 3,472,550 | 4,070,295 | 1,146,605 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,392,000 | 559,750 | 559,750 | - | 2,236,000 | 717,000 | 717,000 | - |
| (iv) | වෙනත් ආදායම් | 6,857,000 | 20,223,707 | 20,141,627 | 164,160 | 7,377,000 | 8,076,481 | 158,918,925 | 82,080 |
| | | 25,132,990 | 29,053,644 | 28,160,140 | 4,296,037 | 25,056,200 | 16,224,131 | 166,328,055 | 3,402,533 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.2,173,848 ක් වූ අතර වර්ෂය අවසානයට එම ශේෂය රු.2,672,202 ක් විය. | ඉදිරියේදී හිඟ ආදායම් අය කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට සභාව සතු කඩ කාමර 61 කින් රු.1,319,455 ක හිඟ ආදායමක් අය විය යුතුව පැවතුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු සිදු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |
| (ඇ) | 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 06 වන ඡේදය ප්‍රකාරව සභාව සතු කඩකාමර 51 කට අදාළව චක්‍රලේඛය ප්‍රකාරව බදු මුදල් තක්සේරු කර නොතිබුණි. | නව තක්සේරු ලබා ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ලැබිය යුතු උසාවි දඩ රු.1,190,000 ක් හා මුද්දර ගාස්තු රු.80,137,980 ක් විය. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |
| (ඉ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තිය යටතේ දුරකථන සම්ප්‍රේෂණ කුළුණු පවත්වාගෙන යන සමාගම් 03 ක් විසින් සභා බල ප්‍රදේශයේ ස්ථාපිත කර තිබූ කුළුණු 09 ක් වෙනුවෙන් රු.33,000 ක ව්‍යාපාර බදු අයකර නොතිබුණි. | ආයතන 02 ක් 2022 සහ 2023 වර්ෂයන්ට අදාළ ගෙවීම් එකවර ගෙවීමට කටයුතු කරන බව දැණුම් දී ඇති බවත්, එක් ආයතනයක් වෙත අවසන් සිහිකැඳවීම් ලිපි යොමු කර ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------- | ----------- |
| (අ) | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව ත්‍රී රෝද රථ ලියාපදිංචි කිරීම, පුද්ගලික හා ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථාන පැවැත්වීම, සීතගල්ල පිහිනුම් තටාකය පවත්වාගෙන යාම හා නාගරික නොවන බල ප්‍රදේශය තුල ගොඩනැඟිලි සැලසුම් අනුමත කිරීම හා ඉඩම් අනුබෙදුම් සම්බන්ධ කටයුතු සඳහා අතුරු ව්‍යවස්ථා පනවාගෙන නොතිබුණි. | පළාත් පාලන අයතනයන්ගේ සංසදය විසින් අතුරු ව්‍යවස්ථා සකසමින් පවතින බවත් පළාත් පාලන අයතන වෙත ලබා දීමට අපේක්ෂා කරන බව දන්වා ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 2022 පෙබරවාරි මාසය වන තෙක් පෞද්ගලික ඉඩමකට කසළ බැහැර කර තිබූ අතර ඊට එරෙහිව ඇතිවූ මහජන විරෝධය මත කසළ එක්රැස් කිරීම නතර කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සභා බල ප්‍රදේශය තුළ ජනනය වන කසළ එකතු කිරීමට සහ නිසි පරිදි බැහැර කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සැලසුම් කර නොතිබුණි. | පෞද්ගලික ඉඩමක් කුලියට ගෙන එහි දිනපතා එකතුවන කසළ බැහැර කිරීමට කටයුතු කරන බව. | ස්ථිර හා විධිමත් කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළ යුතු වේ. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------- | ----------- |
| (අ) | පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගනු ලැබූ දික්වැල්ල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය, දික්වැල්ල ප්‍රාදේශීය සභා පෙර පාසල හා රදම්පල නැණසල මධ්‍යස්ථානයට අයත් ඌනතා ලෙස හඳුනාගත් රු.116,215 ක් වටිනා භාණ්ඩ වර්ග 23 කට අයත් අයිතමයන් 144 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 760 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2022 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කරන බව. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

### 3.3 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------- | ----------- |
| 2009 අප්‍රේල් 16 දිනැති හා අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02(iv) වගන්තියේ විධිවිධානවලින් බැහැරව ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් පැමිණීම හා පිටවීම සනාථ කර නොගෙන දින 17 ක් වෙනුවෙන් එක් නිලධාරිනියකට නිවාඩු දින වැටුප් ලෙස රු.39,344 ක් ගෙවා තිබුණි. | පැමිණීමේ ලේඛණයේ පමණක් අත්සන් තබා ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා කාලය තුල සභාව විසින් දික්වැල්ල මහජන ක්‍රීඩාංගනයේ ළමා උද්‍යානයේ හා පෙර පාසලේ ආරක්ෂිත වැටවල් ඉදිකිරීමද දික්වැල්ල මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමද යන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී සියළු වැඩ කොටස් හඳුනාගෙන මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල නොකර රු.16,155,404 ක වටිනාකමකට ඇස්තමේන්තු 11 ක් පිළියෙල කර ප්‍රජා සංවිධාන 02 ක් මගින් ඇස්තමේන්තු මුදලට ව්‍යාපෘතිය සිදු කරවාගෙන තිබුණි. | මෙම ව්‍යාපෘති ඉටුකිරීම සභාවේ පවතින අරමුදල් ප්‍රමාණයන් මත හා කාලීනව මතුවන අවශ්‍යතා අනුව ඇස්තමේන්තු සකස් කර ව්‍යාපෘති සිදුකරන ලද බව. | මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කර ටෙන්ඩර් කැඳවීම මගින් කොන්ත්‍රාත් පිරිනැමීමේදී තරඟකාරී මිල ගණන් තුලින් ලැබෙන මිල වාසිය ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | චීන ආධාර ලැබීම් යටතේ මාතර-කතරගම දුම්රිය මාර්ගයෙන් විනාශ වූ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා ලැබී තිබූ ප්‍රතිපාදන මත හා සභා අරමුදල් ප්‍රතිපාදන මත සමාලෝචිත වර්ෂය තුල රු.5,976,545 ක ඇස්තමේන්තුගත මුදලකට ඍජු කොන්ත්‍රාත් පදනම යටතේ ප්‍රජා පාදක සංවිධාන විසින් කොන්ක්‍රීට් අතුරා සංවර්ධනයකර තිබූ මාර්ග 03 ක 2022 නොවැම්බර් 17 දින සිදු කළ කොන්ක්‍රීට් ඇතිරුමේ ඝනකම් පරීක්ෂාවේදී (core cutting test) ලබා ගත් සාම්පල 15 න් 06 ක කොන්ක්‍රීට් ඇතිරුම ඇස්තමේන්තු ප්‍රකාරව මීටර් 0.125 ක ප්‍රමාණයක නොතිබුණි. | එක් මාර්ගයකට අදාලව අඩු වූ ඝණකමට අදාල මුදල කොන්ත්‍රාත් සමිතිය වෙතින් අයකර ගැනීමට කටයුතු යොදා ඇති බවත්, මාර්ග දෙකක ඝණකම අඩු වී ඇති කොටස්වල කොන්ක්‍රීට් පරිමාව සඳහා අඩු කර රඳවුම් මුදල් නිදහස් කිරීමට කටයුතු යොදා ඇති බව. | ඉදිකිරීම නියමිත ප්‍රමිතියට සිදු කළ යුතු වේ. |
| (ඉ) | චීන ආධාර යටතේ මාතර-කතරගම දුම්රිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී විනාශ වූ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා 2015 ත් 2020 ත් අතර කාලසීමාව ඇතුලත අවස්ථා 03 කදී රු.12,000,000 ක මුදලක් ලැබී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉතිරි වූ රු. 6,100,110 ක මුදල් සභාව වෙත ලැබී වර්ෂ 02 කට වැඩි කලක් ගතව ඇතත් සංවර්ධනය කිරීමට යෝජිත ඉතිරි මාර්ග සංවර්ධනය කර නොතිබුණි. | 2020 වර්ෂයේදී රු.1,018,708 කින් යුක්ත ව්‍යාපෘති 03 ක් හා 2022 වර්ෂයේදී රු.1,936,222 කින් යුතු එක් ව්‍යාපෘතියක් සිදු කරන ලද බවත්, 2023 වර්ෂයේදී ඉටුකිරීම සඳහා රු.8,698,733 ක ඇස්තමේන්තු වටිනාකමින් යුක්ත ව්‍යාපෘති 05 ක් සිදු කිරීමට ගිවිසුම් ගත වී ඇති බව. | කඩිනමින් ව්‍යාපෘති ඉටු කළ යුතු වේ. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සෞඛ්‍ය කම්කරුවන් දෙදෙනෙකු සහ රියදුරු සහයකයකු වෙත තනතුරට අදාළ නියමිත රාජකාරී පැවරීමකින් තොරව රාජකාරී පවරා තිබුණු අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.4,461,486 ක මුදලක් සභා අරමුදලින් වැයකර තිබුණි. | සේවා අවශ්‍යතාවය මත සේවයේ යොදවා ඇති බව. | තනතුරට අදාළ නියමිත රාජකාරි පැවරිය යුතු වේ. |
| (ආ) | සභාවේ සේවය කර ස්ථාන මාරුවී ගිය, සේවය හැර ගිය, සේවය අත්හිටවූ හා මිය ගිය සේවකයින් 08 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු.803,350 ක ණය ශේෂය වසර ගණනාවක සිට අය නොවී පැවතුණි. | හිඟ අය කර ගැනීමට කටයුතු කරන බව. | කඩිනමින් අය කර ගත යුතු වේ. |